# කොවිඩ් 19 වෛරසය ව්‍යාප්තිය වැලැක්වීම සදහා නරඹනන් හා පාඨකයන් අනුගමනය කළයුතු මාර්ගෝපදේශන සංග්‍රහය.

01.ඔබ කෞතුකාගාර පරිශ්‍රයට ඇතුල් වීමට පෙර තත්පර 20 ක් දැත් හොදින් සෝදන්න. මේ සදහා ඔබට පහසුකම් සපයා ඇත.

02. කෞතුකාගාරයට හෝ පුස්තකාලයට ඇතුළු වීමට පෙර නිසි පරිදි පාවහන් යටිපතුල් විෂබීජ හරණය වන සේ විෂබීජ නාශක පාපිස්ස තුලින් පැමිණෙන්න.

03. මුඛ ආවරණ පැළද සිටීම අනිවාර්ය වේ.

04. කෞතුකාගාර පරිශ්‍රය තුලට ගමන් මළු, හෙල්මට් හා කබා (jeket) ආදිය රැගෙන ඒමෙන් වලකින්න.

05.ඔබට කිවිසුමක් කැස්සක් ඇති වුවහොත් මුහුණ (මුඛය / නාසය) ටිෂූ එකක් හෝ අත නවා වැලමිට ප්‍රදේශයෙන් ආවරණය කර ගත යුතුය.

06. ඔබට කැස්ස, සෙම්ප්‍රතිශ්‍යාව හෝ උණ පවතීනම් කෞතුකාගාර පරිශ්‍රය තුලට ඇතුල් වීමෙන් වළකින්නව

07. සෑම විටම මීටරයක පරතරය තබා ගැනීමට කටයුතු කරන්න.

08. ප්‍රවේශ පත්‍ර ලබාගැනීම සදහා අදාල මුදල පමණක් ටිකට් නිකුත් කරන්නට ලබා දී ප්‍රවේශ පත්‍ර ලබා ගැනීමට උත්සාහ කරන්න.

09. සෑම නරඹන්නෙක්ම තම ප්‍රවේශ පත්‍රය තමා ළඟම තබා ගත යුතුය.

10. කෞතුකාගාරය තුලට එකවර ඇතුළු කරනු ලබන්නේ නරඹන්නන් 10 දෙනෙකු පමණක් බවට දැනුවත් වන්න.

11.ප්‍රවේශ පත්‍රය අවලංගු කිරීම සදහා ටිකට් පරීක්ෂක වෙත එය ඉදිරිපත් කල යුතුය.

12. නරඹන්නන් විසින් කෞතුකාගාර කාර්ය මණ්ඩලය මගින් සපයන විෂබීජ නාශක දියරයෙන් අත් සෝදා ගත යුතුය.

13. නරඹන්නන් විසින් කෞතුකාගාරය තුල ඇති ප්‍රදර්ශන භාණ්ඩ, නාම පුවරු, පාදස්ථල හා විදුලි උපකරණ ආදිය ඇල්ලීමෙන් වළකින්න.

14. තරප්පු පෙලෙහි අත් වැට අවම වශයෙන් භාවිත කිරීමට උත්සාහ ගන්න.

15. ප්‍රදර්ශන මැදිරි තුල සේවයේ නියුතු කෞතුකාගාර කාර්ය මණ්ඩලය සමග කථා කිරීම අවම කරන්න.

16. නරඹන්නන් විසින් පැලදි මුඛ ආවරණ, අත් වැසුම් හා අත් පිස්නා ආදි ද්‍රව්‍ය කෞතුකාගාර පරිශ්‍රය තුල බැහැර කිරීමෙන් වලකින්න.

17. පිටතින් රැගෙන එන ආහාර කෞතුකාගාර පරිශ්‍රය තුලදි අනුභව කිරීමෙන් වළකින්න.

18. නරඹන්නන්ගේ තොරතුරු ඇතුලත් කිරීමේ ලේඛනය පවත්වා ගෙන යාමට අවශ්‍ය තොරතුරු ලබාදී සහය වන්න.

## කොවිඩ් 19 රෝග ව්‍යාප්තිය වැලැක්වීම සදහා පුස්තකාල පාඨකයන් අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග

1. පාඨකයන්ගේ තොරතුරු ඇතුලත් කිරීමේ ලේඛනය පවත්වා ගෙන යාමට අවශ්‍ය තොරතුරු ලබාදී සහය වන්න.

2. පුස්තකාලයට පැමිණෙන පාඨකයින් අත් ආවරණ පැලදීම අනිවාර්ය අතර ඒවා භාවිතයෙන් පසු රැගෙන යා යුතුය.

3. පුස්තකාලය තුල පොත් පරිහරණය කරන අතරතුර ජංගම දුරකතන භාවිතයෙන් වළකින්න.

4. පුස්තකාලයට පැමිණෙන පාඨකයන් විසින් පෑන්, පැන්සල් රැගෙන පැමිණිය යුතු අතර, කාර්ය මණ්ඩලයෙන් ඒවා ඉල්ලීම නොකල යුතුය.

5. එක් වරකට පුස්තකාලයෙන් එක් පොතක් පමණක් ඉල්ලීමට වග බලා ගන්න.